Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



:1* ශිල්ප කලා විෂය හදාරා පාසැල් හැර යන අය ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම පිණිස පාසල තුළ ශිල්ප කලා සංගමයක් පිහිටුවා විසිතුරු ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

I මෙම ශිල්ප කලා සංගමය සඳහා නිර්මාණශිලි තේමාපාඨයක් ලියන්න.

II මෙම සංගමය හා ප්‍රදර්ශනය නැරඹීමට ඇරයුම් කිරීම සඳහා සුදුසු තනි පිටුවේ ආරාධනා පත්‍රයක් නිර්මාණශීලිව සකස් කරන්න.

III ප්‍රදර්ශනයේ සංවිධායක මණ්ඩලය සඳහා පැළඳීමට සුදුසු ලාංජනයක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

IV උත්සව අවස්ථාවේදී ආරාධිත අමුත්තා පිළිගැනීමට සුදුසු මල් මලාවක දළ රූප සටහනක් ඇඳ දක්වන්න.

V ප්‍රදර්ශනයේ පිවිසුම් දොරටුව ගොක්කොළ ආධාරයෙන් අලංකාර කර ගැනීමට සුදුසු ජටා වියමන ඇඳ දක්වන්න.

VI ප්‍රදර්ශනයට තැබීම සඳහා ඇඹීම මඟින් නිර්මාණය කළ හැකි මැටි ආශ්‍රිත සත්ත්වයින් දෙදෙනකුගේ රූප සටහන් දෙකක් ඇඳ දක්වන්න.

VII ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට සුදුසු කුෂන් කවරයක් සඳහා පැච්වර්ක් මෝස්තරයක් ඇඳ දක්වන්න.

VIII ප්‍රදර්ශන ආරම්භක අවස්ථාවේ පාසලේ නර්තන කණ්ඩායම විසින් නර්තනයන් ඉදිරිපත් කරනු ලබන අතර එම බාලිකාවන්ගේ ඇඳුම් සඳහා අතින් පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

IX ප්‍රදර්ශනයේ දක්ෂතා එළිදැක්වූ ජයග්‍රාහකයින් සඳහා පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.

X එම ජය සංකේත ඇතුළත් කිරීම සඳහා සෘජුකෝණාසාකාර පැති සහිත පෙට්ටියක්ද සුදානම් කර ඇත. එහි විකසනය ඇඳ දක්වන්න.

:2* රෙදි පිළි අලංකරණය කර ගැනීමට විවිධ ක්‍රම භාවිතා කරයි.

I අතින් පින්තාරු සිදු කිරීමේදී මුද්‍රණ තලයක් සකස් කරන ආකාරය කෙටියෙන් ලියන්න.

II සිදුරු තහඩු මුද්‍රණය සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

III අච්චු මුද්‍රණය ආශ්‍රිතව කුෂන් කවරයක් අලංකාර කර ගන්නා ආකාරය ලියා දක්වන්න.